# මෛත්‍රී දේශනය

දේශකයාණන් වහන්සේ

## අති පුජනීය නාඋයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ

පරිගනක ගතකිරීම

ලලිත් සිරිමෙවන් දිසානායක

2005-02-09

# ප්‍රස්තාවනාව

සම්මා සම්බුද්ධ ශාසනය රස වශයෙන් එකම අමා රසයෙන් සමන්විතයි. **"අයං ධම්ම විනයෝ ඒක රසෝ විමුක්ති රසෝ"** අමා රසයෙන් විමුක්ති රසයෙන් රසවත්වූ සද්ධර්මය පිරිනැමීම අමෘතය බෙදා දීමකි. **" අමතං දදෙව සො හොති- යො ධම්ම මනුසාසති"** අමෘත වාහී සම්බුදු දහම ප්‍රදානය කිරීම සෑම දන් අභිබවා ජය ලබන ධර්ම දානයකි. "සබ්බ දානං ධම්ම දානං ජිනාති"

ධර්මය දෙසීම - ඇසීම - රුචි කිරීම දෙලොවම නොපිරිහී ආත්මය දිනාගැනීමේ දොරටුවකි. "ධම්මකාමෝ භවංහොති" ධර්මය දෙසීමෙන්, ඇසීමෙන්, දැරීමෙන්, හැසිරීමෙන් සද්ධර්මය බැබලීමට පත්වන්නේය. **"ධම්ම විනයෝ විවටො විරොචති නොපටිඡන්නෝ"**

කරණීය මෙත්ත සූත්‍රය ඛුද්දක නිකායට අයත් සූත්‍ර නිපාතයෙහි එන ශ්‍රී මුඛ දේශනාවකි. යෝගාවචර පන්සියයක් සහ පිරිසට සැවැත් නුවර දෙව්රම් වෙහෙරදී වදාළ මේ සූත්‍ර දේශනාව ආරක්ෂක පිරිතක් සේම කර්මස්ථාන භාවනාවකි. මෙය භාවිතා කරන අයට සැපසේ නින්ද ලැබේ. සැපසේම අවදි වේ. නපුරු සිහින නොපෙනේ. දෙවියන්ට ප්‍රිය වෙති. මනුෂ්‍යයන්ට ප්‍රිය වෙති. වස, විස, ගිනි, අවි ආයුධ ශරීරගත නොවෙති. සිත වහා සමාධි ගත වෙයි. මුහුණ පැහැපත් වේ. එළඹ සිටි සිහියෙන් අවසන් මොහොත ගතවේ. මෙයින් මෛත්‍රී ධ්‍යාන උපදවා ගත් අය බඹලොව උපදිති. විදර්ශනාවට හැරී භාවනා කිරීමෙන් මග පල නිවනට පැමිණෙන්නාහ.

26-02-1984 මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ පුස්තකාල විහාරස්ථානයේදී සවස 5.00 සිට 6.00 තෙක් කරණීය මෙත්ත සූත්‍රය මාතෘකා කොට මා විසින් එම සූත්‍රය භාවනාවට නංවන ආකාරය දක්වමින් දෙසූ ධර්මය මෙසේ මුද්‍රණය කරවා ධර්ම දානය වශයෙන් බෙදා දීම ගැන විශේෂයෙන් පින් දෙමි.

දේශනාව පටිගත කරන ලදුව ලියා සකස් කරන ලද්දේ තත් විහාරාධිපති පූජ්‍ය යටිනුවර සුමන ස්ථවිරයන් වහන්සේ විසිනි.

මේදින ධර්ම දේශනයට ආරාධනා කරන ලද්දේ දූවගොල්ල යෝගාශ්‍රමයේ ප්‍රධාන සභාපති පින්වත් කේ. ටී. ජයලත් ද සිල්වා දොස්තර මහත්මයා සහ පින්වත් යූ. එච්. ද සිල්වා මුදලාලි මහත්මයාත් විසිනි. පින්වත් පී. බී. සිල්වා සහ පින්වත් ඒ. ඩී. ඇන්ඩ්‍රියස් මහත්මිය දායකත්වය ඉසුලූහ. මෙය මුද්‍රණය කරවා ධර්ම දානය වශයෙන් බෙදීම පිණිස මහනුවර දූවගොල්ල යෝගාශ්‍රමයේ ප්‍රධාන සභාපති පින්වත් කේ. ඊ. ජයලත් ද සිල්වා දොස්තර මහත්මයා සිය ධන පරිත්‍යාගයෙන් සියලුම වියදම් දරා විශේෂයෙන් ඉදිරිපත් වූ අතර

කොග්ගල ත්‍රිපිටක ධර්මායතනයේ භාන්ඩාගාරික පින්වත් කේ. පී. සිරිසේන ද සිල්වා මහත්මයා පොතේ මුද්‍රන කටයුතු නිමකර දීම සඳහා බෙහෙවින් සහාය විය.

පූජ්‍ය යටිනුවර සුමන ස්ථවිරයන් වහන්සේ ඇතුලු ඉහත නම් සඳහන් සැම දෙනාටම මේ ධර්ම දානමය කුශලානිසංශයෙන් හා රතනත්‍රයානුභාව බලයෙන් නිදුක් නීරෝගී දීඝායු ශ්‍රී සම්පත්තිය හා ශාන්ත නිවන් සුවයත් අත් වේවා.

**"සුඛිනෝවා ඛෙමිනෝ හොන්තු**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා"**

මෙයට

**නාඋයනේ අරියධම්ම ස්ථවිර**
ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය
ගල්දුව - කහව 80312
අම්බලන්ගොඩ.

---

# ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ සංඝා ලේඛකාධිකාරී අතිගරු නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ විසින් 1984-02-26 දින මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ පොත්ගුල් විහාරයේදී පවත්වන ලද ධර්ම දේශනාව

**"නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස"**

"කරණීය මත්ථ කුසලේන යන්තං සන්තං පදං අභිසමෙච්ච සක්කෝ උජුච සුජුච සුවචෝ චස්ස මුදු අනතිමානි "

**ශ්‍රද්ධාවන්ත පින්වතුනි**

තුන්ලෝකාග්‍ර අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ වදාල කරණීය මෙත්ත සූත්‍රයට අයත් පළමු ගාථාව මා මාතෘකා කරගන්නට යෙදුනා. කාටත් පාඩම් තියෙන මේ සූත්‍රය භාවනාවක් වශයෙන් භාවිතා කරන්නේ කෙසේද කියා පැහැදිලි කර දීමට මා බලාපොරොත්තු වෙනවා. බුදුරජානන් වහන්සේ ගේ සැම ධර්ම දේශනාවක්ම භාවනාවක් බව අට්ඨ කථාවල මෙසේ

දක්වා තිබෙනවා. "කම්මට්ඨාන විනිමුත්තාහි ධම්ම දේසනා නාම නත්ථි." කර්මස්ථානයකින් තොර භාවනාවකින් තොර ධර්ම දේශනාවක් ඇත්තේම නැහැ. [ සතිපට්ඨාන අට්ඨ කථාව සාමඤ්ඤඵල සූත්‍ර අට්ඨ කථාව දක්වා තිබෙනවා.] එම නිසා බුදුරජාණන්වහන්සේ වදාළ ධර්මය මගපල නිවන් ගෙන් දෙන භාවනා මාර්ගයක් බව මෙහිදී පැහැදිලි වෙනවා. බුදුරජාණන්වහන්සේ ධර්මය දේශනා කරන අවස්ථාවන්හිදී අසංඛ්‍ය ගණන් පිරිස් නිවන් අවබෝධ කරගන්න සමත් වුවා. දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවේදී අඤ්ඤාකොණ්ඩඤ්ඤ මාහිමියන් ඇතුලු පිරිස අසංඛ්‍යයයක් සෝවාන් ඵලයට පත්වුනා දහ අට කෝටියක් අර්හත් ඵලයට පත්වුනා. මහා මංගල සූත්‍ර දේශනාවේදී කෝටි ලක්ෂයක් දෙවියන් බ්‍රහ්මයන් අර්හත්වයට පත්වූ අතර අසංඛයක් සත්වයන් මාර්ග ඵල නිවන් අවබෝධ කළා. මක්නිසාද ධර්ම ශ්‍රවණය ධර්ම දේශනාව භාවනා මාර්ගයක් නිසා.

අප කරණීය මෙත්ත සූත්‍රය භාවිතා කරන්නේ ආරක්ෂා පිරිතක් වශයෙනුයි. දෙවියන් ප්‍රිය කරණ සෑම දෙනාගේම මෛත්‍රිය දිනාගැනීමට හේතුවන අන්තරාවන් නිවරණය වන ආනුභව සම්පන්න පිරිතක් ලෙසත් බොහෝවිට භාවිතා කරණවා. ඇත්ත වශයෙන්ම එය ආනුභව සම්පන්න පිරිතක් මෙන්ම භාවනා මාර්ගයක්.

බුද්ධ කාලයේ ස්වාමීන් වහන්සේලා සියය පන්සියය දහ වශයෙන් ආරණ්‍යවලට ගොස් භාවනා කිරීමට පුරුදුව සිටියා. එයින් පන්සියයක් භික්ෂූන් වහන්සේලා උගතමනා ධර්මය උගෙන අවුරුදු පහකින් නිස මුක්තව කමටහන් ලබාගෙන වස්සාන කාලය ළඟාවත්ම සැවැත් නුවර සිට යොදුන් එකසිය විස්සක් පමණ දුර අරණ්‍යයට වැඩියා මෙම අරණ්‍ය ඉතාම සිත්කළු ජල ධාරාවකින් යුක්ත සුන්දර පරිසරයකින් යුක්ත තැනක්.පසුද අවට ගමකට පිඩුසිඟා වැඩියා. දන් පිළිගැන්වූ දයක පිරිස ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු විමසා වස් කාලය තුල සිවුපසයෙන් උපස්ථාන කරණ බවට පොරොන්දු වී අරණ්‍ය සේනාසනයේම වස්වසා වැඩ වෙසෙන ලෙසට ආරාධනය කළා.

වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේලා භාවනා කිරීමට පටන් ගත්තා. භික්ෂූන් වහන්සේලාගේ ශීල තේජස නිසා වෘක්ෂ දේවතාවුන්ට ඉහලින් සිටින්නට නොහැකිව බිමට බැස්සා. වස් කාලය අවසන් වනතුරු මේ අය මෙතැනින් පිටත්ව නොයන බව තේරුම් ගත් දේවතාවරු නපුරු රූප මවමින් ශබ්ද නගමින් දුර්ගන්ධය වහනය කරමින් භික්ෂූන් වහන්සේලා බියට පත් කරන්න පටන් ගත්තා. දින පහලොවක් ගතවීමෙන් පසුව පන්සියයක් දෙනා වහන්සේම රෝගාතුර වුනා. කාටත් මෙම ස්ථානය පළිබෝධ සහිත තැනක් බව තේරුනා. සෑම දෙනාවහන්සේම කල්පනා කළා බුදුරජාණන් වහන්සේ හමුවීමට ගොස් භාවනාවට සුදුසු වෙනත් තැනක් සොයා ගත යුතුයි කියලා සියළු දෙනා

වහන්සේම දෙවුරමට ගොස් බුදුරජාණන් වහන්සේට කාරණය පැහැදිලි කළා. උන් වහන්සේ කාරණය තේරුම් ගත්තා. මහණෙනි මේ මුලු දඹදිවු තලයේම මම පරීක්ෂාකර බැලුවා මේ සඟ පිරිසට ජය බිම නම් එම තැනමයිග එම නිසා එම අරණ්‍යයටම වඩින්න. මුලින්ම ගෙන නොගිය ආරක්ෂාවක් මා දෙන්නම් කියා මේ කරණීය මෙත්ත සූත්‍රය ගාථා දහයක් සහිතව දේශනා කලා. ස්වාමීන් වහන්සේලා මෙය පාඩම් කරගෙන බුදුරජාණන් වහන්සේ ඉදිරිපිට සජ්ඣායනා කර පියවරක් පාසා කරණීය මෙත්ත සූත්‍රය මෙනෙහි කරමින් එම අරණ්‍යටම වැඩම කලා. පන්සියයක් දෙනා වහන්සේම මෙම සූත්‍ර ගුණ සජ්ඣායනා කරමින් අරණට ඇතුල් වුනා. මෙම සූත්‍රයේ ඇතුලත් මෛත්‍රියේ ආනුභාවයෙන් වන දේවතාවෝ, වෘක්ෂ දේවතාවෝ, විමාන දේවතාවෝ මනුෂ්‍ය වේෂයෙන් ඉදිරියට පැමිණ සිවුරු පිරිකර පිළිගෙන පැන් තබා පවන් සලා මලු පෙත් මං ඇමද ඉතා ගෞරවයෙන් සියලු උපස්ථාන කළා. ස්වාමීන් වහන්සේලා මේ දේවතාවන් බව දනගෙන සිටියේ නැහැ. වනයේ ශබ්ද කරණ පක්ෂීන්, සිවුපාවන් ආදීන් දෙවියන් විසින් වනයෙන් ඈත්කර භාවනාවට නිශ්ශබ්දතාවය රැක දුන්නා.

භාවනාවේ යෙදුන ස්වාමීන් වහන්සේලාට මේ කරණීය මෙත්ත සූත්‍රය තුලින් මෛත්‍රී ධ්‍යාන තුනක් ලැබුනා. එම මෛත්‍රී ධ්‍යානයෙන් නැගී සිට විදර්ශනා කිරීමෙන් උදයව්‍යයඥාන දර්ශනය පහළ වුනා. මේ බව බුදුරජාණන් වහන්සේ දෙවුරම් වෙහෙර සිට බුදු ඇසින් දැක්කා. බුදුරැස් මාලාවක් අරණ්‍යයට යැවුවා. ඒ තුලින් තමන් ඉදිරියේ ජීවමාන බුදු රුව පෙනී සිටිමින් දේශනා කරන ලද ධර්ම ගාථාවක් ඇහුනා.

"කුම්භූපමං කායමිමං විදිත්වා
නගරූපමං චිත්තමිදං ඨපෙත්වා
යොධෙථ මාරං පඤ්ඤාවුධෙන
ජිතඤ්ච රක්ඛෙ අනිවෙසනෝසියා"

මේ ගාථාවෙන් දහම් දේශනා කළා. මේ ශරීරය බිඳෙන මැටි බඳුනක් මෙන් අනිත්‍යයයි සිතන්න. මේ චිත්ත සන්තානය සකල සම්පත්තයෙන් පිරුණු නගරයක් මෙන් ආරක්ෂා කරන්න. විදර්ශනා ප්‍රඥා ආයුධයෙන් කෙලෙස් මරුට පහර දෙන්න. එයින් ලබන ජය ආරක්ෂා කරගන්න. මේ ලෝකය පිළිබඳ ඇල්මක් තබා නොගන්න.

මේ උපදේශාත්මක විදර්ශනා සම්ප්‍රයුක්ත ගාථාවෙන් ධර්ම දේශනා කළ කෙනෙහි පන්සියයක් දෙනා වහන්සේ විදර්ශනා ප්‍රඥාව මුදුන් බවට පත්වුනා. එම ඉරියව්වේම සිට සතර මග සතර පල පිළිවෙලින් රහත් බවට පත්වුනා.

මේ රහතන් වහන්සේලා පන්සිය නම වස් පවාරණය කර බුදුරජාණන් වහන්සේ වෙත වැඩමකර කරණීය මෙත්ත සූත්‍රය පාදක කරගෙන ධ්‍යාන වැඩූ සැටිත් ධ්‍යානයෙන් විදර්ශනාවට හැරී මගපල නිවන් ලබාගත් සැටිත් පැහැදිලි කරමින් අර්හත් මාර්ග ඵලයෙන් බුදුරජාණන් වහන්සේට බුද්ධ පූජා පැවැත්වූවා. මේ කරණීය මෙත්ත සූත්‍රය දේශනාවට හේතු වූ කාරණයයි.

මේ දේශනාවෙන් පැහැදිලි වෙනවා ස්වාමීන් වහන්සේලාට මේ කරණීය මෙත්ත සූත්‍රය ආරක්ෂක පිරිතක් වූ අතර මෛත්‍රී කර්මස්ථාන වැඩෙන භාවනාවක් වූබව. එයම විදර්ශනාවට පාදක වුනා. එමගින් අර්හත්වය සිදුවුනා.

මෙසේ අර්හත්වයට පත්වන්නට හේතුවූයේ ඈත බුද්ධ ශාසනවලදී ද මේ පන්සියයක් දෙනා වහන්සේ මෙම සූත්‍රය අහලා පාඩම් කරගෙන දරාගෙන එයට අනුව හිත දියුණු කරලා වාසනාව තිබුණ නිසාය. ඒ නිසාමයි මෙම සූත්‍රය තුලින් ධ්‍යාන ලබන්නටත් මගඵල නිවන් අවබෝධ කරන්නටත හේතු වාසනා වුනේ. එම නිසා අපටත් දිනපතා කරණීය මෙත්ත සූත්‍රය භාවිතා කිරීමෙන් අත්වන පින නිසාත් එය භාවනාවට හරවා දියුණු කිරීමෙනුත් කවද නමුත් මගඵල නිවන් සුව ලැබෙන්න එය හේතු වාසනා වෙන්න පුළුවනි.

මීලගට අපි සලකා බලන්න ඕනෑ මේ සූත්‍රයේ තේරුම, මේ සූත්‍රයේ තියෙන ගාථා දහයෙන් ගාථා දෙකහමාරකින් දේශනා කරලා තියෙනවා නිවන් මග යන පින්වතුන් විසින් පිළිපැදිය යුතු කරුණු පහළොවක්. කරණීය ධර්ම දහ හතරක් සහ අකරණීය ධර්ම එකක් වශයෙන්. දහවැනි ගාථාව හැර ඉතිරි සියළුම ගාථාවලින් මෛත්‍රී භාවනාව විස්තර කර තියෙනවා.දහවැනි ගාථාවෙන් දේශනා කරලා තියෙන්නේ විදර්ශනා භාවනාවට හා මාර්ග ඵල නිවන් ලැබීම පිළිබඳ උපදෙස්ය. එතකොට මුළු බුද්ධ ධර්මයම මේ සූත්‍රයට ඇතුලත් වී තිබෙනවා. සීලයත් සමාධියත් ප්‍රඥාවත් වශයෙන් සීල සමාධි ප්‍රඥා යම් තැනක තබෙනවා නම් එතැන ආර්ය අෂ්ඨාංගික මාර්ගය තිබෙනවා.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය යම් තැනක තිබෙනවා නම් එතැන සත්තිස් බෝධිපාක්ෂික ධර්මයම තියෙනවා. සත්තිස් බෝධිපාක්ෂික ධර්මය යම් තැනක තිබෙනවා නම් එතැන සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අර්හත් මාර්ග ඵල ඒකාන්තයෙන්ම ලැබෙනවා මෙකයි බුද්ධ ශාසනයේ අනු පිළිවෙල. මීලඟට මාතෘකා කළ ගාථාවේ තේරුම ප්‍රකාශ කරනවා.

> කරණීයමත්ථ කුසලේන........... මේ ගාථාවෙන් වදළ
> "සන්තං පදං අභිසමෙච්ච යං කරණීයං අත්ථ කුසලේන
> තං කරණීයං"

ශාන්ත පද සංඛ්‍යාත නිවනට පැමිණීම පිණිස යමක් කටයුතු නම් අර්ථ කුසලයා විසින් ඒ අවශ්‍ය දෙය ඉෂ්ඨ කළ යුතුය යනුවෙන් උපදේශයක් වශයෙන් මුලින්ම දේශනා කළා. ශාන්ත පදය කියන්නේ නිර්වාණයට නමක්. නිර්වාණය ශාන්තයි පදය කියන්නේ මෙතැන ධර්මය කියන තේරුම ඇති වචනයක්. නිර්වාණය ශාන්ත ධර්මයක් නිවනෙහි අශාන්ත කිසිවක් නැහැ.අශාන්ත වන කිසිවක් නැති නිසා ශාන්තයි. යම් තැනක ඉපදීමක්, ජරාවක්, මරණයක්, ශෝකයක් පරිදේවයක්, දුකක්, දොම්නසක්, සිත් තැවුලක්, අප්‍රියයන් හා එක් වීමක්,ප්‍රියයන්ගෙන් වෙන්වීමක්ත තියෙනවා නම් එතන ශාන්තයි. එමෙන්ම ස්කන්ධ පරිහරණයක් තිබෙනවා නම් එතැන අශාන්තයි. ඒ වගේම මහ පොළවක් තිබෙනවා නම්, ගින්දරක් පොළවක් තිබෙනවා නම්, සුළගක් තිබෙනවා නම් එතැන අශාන්තයි. සිවුපාවුන් ඉන්නවා නම් තිරිසතුන් සිටිනවා නම් ප්‍රේතයෝ සිටිනවා නම් මනුෂ්‍යයෝ සිටිනවා නම් දෙවියෝ සිටිනවා නම් බ්‍රහ්මයෝ සිටිනවා නම් එතැන අශාන්තයි. මක්නිසාද නාම රූප එතැන තියෙන නිසා යම් තැනක නාම රූප තියෙනවා නම් එතැන ස්කන්ධ තියෙනවා ආයතන තියෙනවා ධාතු තියෙනවා ඉන්ද්‍රිය තියෙනවා ආර්ය සත්‍ය තියෙනවා පටිච්ච සමුප්පාදය තියෙනවා සුවිසි ප්‍රත්‍යය තියෙනවා මේවා යම් තැනක තියෙනවා නම් එතැන අශාන්තයි.

නිර්වාණ ධාතුවේ මේ කිසිවක් නැහැ. අශාන්තයි. නිර්වාණයේ ඉපදීමක් නැති නිසා ශාන්තයි ජරාවක් මරණයක් නැති නිසා ශාන්තයි.ශෝක පරිදේව දුක් දොම්නස් උපායාස නැති නිසා ශාන්තයි. අප්‍රියයන් හමු නොවන නිසාත් ප්‍රියයන්ගෙන් වෙන් වීමක් නොමැති නිසාත් ශාන්තයි. මහ පොළව ජලය ගින්දර සුළග ආදිය නැති නිසා ශාන්තයි. නාම රූප ස්කන්ධ ධාතු ආයතන ඉන්ද්‍රිය පටිච්ච සමුප්පාද සුවිසි ප්‍රත්‍යය හේතු ඵල න්‍යායය කිසිවක් නැති නිසා නිර්වාණය ශාන්තයි. මේ ශාන්ත පදයට පැමිණීමට පිළිවෙලක් අනුගමනය කළ යුතු නම් ඒවාට කියනවා කරණීය ධර්ම කියා ඒ කරණීය ධර්ම අර්ථ කුසලයා විසින් අනුගමනය කල යුතුයි.

**කරණීය ධර්ම මොනවාද? සක්කෝ-නිවන් මග යාමට සමර්ථ විය යුතුයි. උජු- සෘජුව යා යුතුයි. සුජු- විශේෂයෙන්ම සෘජුව යා යුතුයි. මුදු- මෘදු කෙනෙකු විය යුතුයි. අනතිමානි- නිහතමානීව යා යුතුයි. මේ පළමුවෙන් කියවුනු කරුණු හයයි.**

"සන්තුස්සකොච සුභරෝච අප්පකිච්චෝච
සල්ලහුකවුත්ති සන්තින්ද්‍රීයොච නිපකොච
අප්පගබ්බෝ කුලේසු අනනු ගිද්ධෝ"

**ලද පමණින් සතුටු වෙමින් නිවන් මග යා යුතුයි. ලද දෙයින් යැපෙමින් නිවන් මග යා යුතුයි. සැහැල්ලු ගති පැවතුම් ඇතුව නිවන් මග යා යුතුයි. මුහුකල නුවණින් යුක්තව නිවන් මග යා යුතුයි. සන්සුන් ඉඳුරන් ඇතිව නිවන් මග යා යුතුයි. කය වචන සංවර ඇතිව නිවන් මග යා යුතුයි. ඥාතීන් ගැනවත් දයක පින්වතුන් ගැනවත් කිසිවකු ගැන නො ඇලෙමින් නිවන් මග යා යුතුයි. මේ ඉතිරි කරුණු අටය.**

"නච ඛුද්දං සමාචරේ කිංචියෙන විඤ්ඤූ පරෙ
උපවදෙය්‍යුං"

බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා වැනි නැණවතුන් විසින් පෙන්වා ඇති කුඩා වුවද පාපයන් නොකරමින් නිවන් මග යායුතුය. කරණීය ධර්ම දහ හතර හා අකරණීය ධර්ම එකය.

මේ කරුණු පහළොව අනුගමනය කළයුතු ධර්ම හැටියට භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නිවණට පැමිණ සිට අන් අයටත් අත දිගු කරමින් මෙහි එන්න යයි කියන ආකාරයෙන් ඒහි පස්සික වශයෙන් භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ පිළිවෙත් මගය. බුදුරජාණන් වහන්සේ සක්කෝ ගුණයෙන් යුතුව නිවණට වැඩියහ. විශේෂයෙන් සෘජුව විශේෂයෙන් සෘජුව සුවචව නිහතමානීව ලද දෙයින් සතුටු වෙමින් සන්සුන් ඉඳුරන් ඇතිව වැඩ අඩු කෙනෙකු හැටියට සැහැල්ලු ගති පැවතුම් ඇතිව මුහුකළ නුවණින් යුතුව කායගර්ව වචීගර්ව නැතිව කිසිවකු කෙරෙහි නො ඇලෙමින් කුඩා වුවත් පාපයක් නොකරමින් භාග්‍යවතුන් වහන්සේ ශාන්ත වූ නිවණට වැඩ වදළහ.

ඒ භාග්‍යවතුන් වහන්සේ වදරනවා මා පැමිණියේ මේ පිළිවෙත් මගෙහිය. ඒ නිසා නිවන් මග යනු කැමති සෑම කෙනෙකුන් විසින්ම මේ පිළිවෙත් මගෙහි යායුතුය යනුවෙන් ඒහි පස්සික ධර්මය මේ විදිහට පහද වදළා.

"සුඛිනෝ වා ඛෙමිනෝ හොන්තු සබ්බේ සත්තා
භවන්තු සුඛිතත්තා"

මේ වචනයෙන් වදලේ මෛත්‍රී කර්මස්ථානයයි. මෛත්‍රී කර්මස්ථානයේ මූල පද තුනක් මෙතැනදි වදළා.

"සුඛිනෝ වා ඛෙමිනෝ හොන්තු සබ්බේ සත්තා
භවන්තු සුඛිතත්තා"

.

සියළුම සත්වයෝ කායික සුවයෙන් සුවපත් වෙත්වා
මානසික සුවයෙන් සුවපත් වෙත්වා
කායික මානසික සුවයෙන් හැමකල්හි සුවපත් වෙත්වා

යනුවෙන් මේ විදිහට මෛත්‍රී භාවනාව කළ යුතුයි.

ඊ ලගට තථාගතයන් වහන්සේ මේ මෛත්‍රියට ගන්න අරමුණු වශයෙන් සත්ව කොට්ඨාශ විස්සක් පහදා වදාළා.

"යෙකෙචි පාණභූතත්ථි තසාවාථාවරාවා අනවසේසා
දීඝාවායේ මහන්තාවා මජ්ජිමා රස්සකානුකථූලා
දිට්ඨාවායෙ ව අද්දිට්ඨා යේවදූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසීවා සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා"

මෙම ගාථා යුගලයේ සත්ව කොට්ඨාශ විස්සක් වෙන් කරලා පෙන්නුවා. යම්තාක් ප්‍රාණීහු වෙත්නම් කෙලෙස් සහිත සත්වයෝ කෙලෙස් නැති රහතන් වහන්සේලා වෙත්නම් මේ සියල්ලෝම ද දික් ශරීර ඇති සත්වයෝද, කෙටි ශරීර ඇති සත්වයෝද, මධ්‍යම ශරීර ඇති සත්වයෝද, මහත් ශරීර ඇති සත්වයෝද, කුඩා ශරීර ශරීර ඇති සත්වයෝද, වටකුරු ශරීර ඇති සත්වයෝද, දුර සිටින සත්වයෝද, ලඟ සිටින සත්වයෝද, දුටු විරූ සත්වයෝද, නො දුටු විරූ සත්වයෝද, උපන්නා වූ සත්වයෝද, උපදිමින් සිටින්නාවූ සත්වයෝ ද යනුවෙන් මේ එක එක සත්ව කොට්ඨාශයක් පාසා සුඛිනෝවා හොන්තු ඛෙමිනොවා හොන්තු සබ්බේ සත්ථා භවන්තු සුඛිතත්තා යනුවෙන් වදළ පරිද්දෙන් නිදුක් වෙත්වා. නීරෝගී වෙත්වා. සුවපත් වෙත්වා කියා මේ පදය යොදා මෛත්‍රී කර්මස්ථානය පහදා වදළා.

මී ලගට දේශනා කළා විශේෂ උපදෙස් ටිකක්

"නපරෝ පරං නිකුබ්බේථ නාතිමඤ්ඤේථ කත්ථ
චිනං කඤ්චි බ්‍යාරෝසනා පටිඝ සඤ්ඤා නාඤ්ඤ
මඤ්ඤස්ස දුක්ඛ මිච්ඡෙයා "

කිසිම කෙනෙක් කිසිවෙකුට වංචාවක් නොකෙරේවා. අවමන් නොකෙරේවා. පටිඝ සඤ්ඤවක් ඇතිකර නොගනීවා. කිසිවක් අන්කෙනෙකුට දුකක් නොසිතාවා. මේ විදිහට සත්වයන්ට වෙන වෙනම මෛත්‍රිය පතුරුවන්ට ඕනෑ.

"මාතා යථා නියං පුත්තං ආයුසා ඒක පුත්ත
මනුරක්ඛෙ එවම්පි සබ්බ භූතේසු මාන සම්භාවයේ
අපරිමාණං"

එකම දරුවකු ඇති මවු කෙනෙක් තමාගේ දිවි නොතකා ඒ දරුවා ආරක්ෂා කරන්නේ යම්සේද, එමෙන්ම සියළු සත්වයෝ තමන්ගේ දරුවන් මෙන් සලකා අප්‍රමාණ ලෙස මෛත්‍රී සිත පැවැත්විය යුතුයි කියා එම ගාථාවෙන් උපදෙස් දී වදාළා.

"මෙත්තං සබ්බ ලොකස්මිං මානසම්භාවයේ
අපරිමානං උද්ධං අධොච තිරියංච අසම්බාධං
අවේරං අසපත්තං"

කිසිම ගැටීමක් නැති, වෛරයක් නැති, හැපීමක් නැති, ආවරණයක් නැති අප්‍රමාණ වූ අවෛර මේ මෛත්‍රී සිත මුළු ලෝක ධාතුවේ උඩ යට සරස දස දිසාවේ ම සෑම කල්හිම පැවැත්විය යුතුයි කියා මේ ගාථාවෙන් වදාළා.

"තිට්ටං චරං නිසින්නෝවා
සයානො වා යාවතස්ස විගත මිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්ම මෙතං විහාරං ඉධමාහු"

සිටගෙන සිටිද්දීද, ඇවිදිමින් සිටිද්දීද,වාඩිවී සිටිද්දීද, සයනය කරද්දීද , යම්තාක් අවදියෙන් සිටිනවා නම් ඒතාක් ද මේ මෛත්‍රි සහගත සිතින් වාසය කරනවා නම් එය බ්‍රහ්ම විහරණයක් වන බව මෙහි ඇති ආනිසංස ඵලය පහදා දෙමින් වදාළා.

ඊ ලගට අවසාන දහවෙනි ගාථාවෙන් වදරණවා විදර්ශනා භාවනා මාර්ගය

"දිට්ඨිංච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගෙධං
නහි ජාතු ගබ්බ සෙය්‍යං පුනරේතීති"

මම මෛත්‍රී කරනවා. අන්‍ය සත්වයන්ට මෛත්‍රී කරනවා කියා මම කියන සත්ව සඥාව සම්පූර්ණයෙන්ම බිඳ දමනවා.ඒකට කියනවා දිට්ඨිඤ්ච අනුපගම්ම කියා. මම කියා කෙනෙක් නැත. නාමරූප දෙකක් ඇත. ස්කන්ධ

පහක් ඇත. ආයතනදොළසක් ඇත. මම කියා කෙනෙක් නැත. ධාතු දහ අටක් ඇත.මම කියා කෙනෙක් නැත. පටිච්ච සමුප්පාද අංග දොළසක් ඇත. මේ විදිහට තමන්ගේ ආත්ම භාවය නාමරූප ආදී වශයෙන් බෙද බෙද නාමරූප පරිච්ඡේද ඤාණයෙන් තේරුම් කරගන්නවා. අවබෝධ කරගන්නවා. ඒ වගේම සත්වයෝ ප්‍රාණියෝ හැතයෝ පුද්ගලයෝ ආදී නම් වලින් හඳුන්වන ලද මේ සත්ව කොට්ඨාශ සත්ව නමින් කිසිවක් නැත. ඇත්තේ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පටිච්ච සමුප්පාද ආදී පරමාර්ථ ධර්ම සමූහයක් පමණක් බව නුවණින් මෙනෙහි කරමින් නාමරූප පරිච්ඡේද ඤාණය උපදවා ගන්නවා.මේ නාමරූප පරිච්ඡේද ඤාණය උපදවා ගැනීමට කියනවා දිට්ඨිංච අනුපගම්ම ආත්ම දෘෂ්ඨිය බිඳ දැමීම කියා.

සීලවා - තමන් රකින සීලයෙන් සිවු පිරිසිදු සීලයෙන් සීලවන්ත වෙනවා. ඒක මුලින්ම සිද්ධ වුනා. දස්සනේන සම්පන්නෝ ඒ නාමරූප පරිච්ඡේද ඤාණය ලබාගෙන ඉන් අනතුරුව උදව්‍ය ඤාණය, භංග ඤාණය, භය ඤාණය, ආදීනව ඤාණය, නිබ්බිද ඤාණය, මුඤ්චිතුකම්‍යතා ඤාණය, පටිසංඛානුපස්සනා ඤාණය, සංඛාරුපෙක්ඛා ඤාණය, අනුලෝම ඤාණය කියන මේ ඤාණ පරම්පරාව උපදවා ගන්නවා නම් එය දස්සන සම්පන්න භාවයයි.

මේ විපස්සනා ඤාණ දර්ශනයෙන් සමන්නාගත වනකොටම සොතාපත්ති මාර්ග ඤාණය ලැබුනානම් ඒකත් දස්සන සම්පන්න භාවයක්. ඒකත් දර්ශණයක්. එතකොට සෝවාන් සකෘදගාමි, අනාගාමි යන මේ අවස්ථා තුනටම පැමිණුනා නම් කාමේසු විනෙය්‍යගෙධං එකලොස් කාම භූමියේ ඉපදීමේ අශාව සම්පූර්ණයෙන්ම ප්‍රහාණය කරගන්නවා. නහි ජාතු ගබ්භ සෙය්‍යං පුනරේතීති ඒකාන්තයෙන්ම නැවත මේ මනුලොවට මේ කාමලෝකයට පටිසන්ධි වශයෙන් නො පැමිණ සුධාවාස බඹ තලයේ ඉපිද එහිදී අර්හත්වයට ඒකාන්තයෙන්ම පැමිණෙන්නේ යයි කියා ඒ බව අන්තිම ගාථාවෙන් දේශනා කළා.

එතකොට මේ සූත්‍ර දේශනාවේ කෙටි තේරුම් ටිකක් මේ ඉදිරිපත් කළේ. මේ සූත්‍රය පාඩම් තියෙන පින්වතුන්ට මෙය තේරුම් ගෙන කියන විට පින්තූර පෙනෙන්නාක් මෙන් හිතට මැවී පෙනෙනවා මෙන්න මේ සැලැස්ම.

අප ඉදිරිපත් කරනවා මේ සුළු දේශනාව භාවනාවක් වශයෙන් සකස් කරගන්නා ක්‍රමයක්. බුදු රජාණන් වහන්සේ වදාළ සෑම දේශනාවක්ම භාවනාවට හරවා ගන්න ඕනෑ. ඒක නිසයි බුදු රජාණන් වහන්සේ වදාළේ "මහා සාගරයේ කොතැනින් දිය බිඳක් ගත්තත් තියෙන්නේ එකම ලුණු රසය කියා" එමෙන්ම බුදු රජාණන් වහන්සේ වදාළ ධර්ම විනයෙහි කොතැනින් බණ පදයක් ගත්තත් එහි ඇත්තේ නිවන් රසයයි.

කරණීය මෙත්ත සූත්‍රය කොහොමද අපි භාවනාවට නගන්නේ කියා බලමු. පාලි වචන වලින් පාලි ගාථා වලින් කොතෙක් කීවත් අපට කුසල් සිදුවෙනවා මිස තේරෙන්නේ නැහැ. අදහස තේරෙන්නේ නැත්නම් එතැන භාවනාවක් වශයෙන් වැඩෙන්නේ නැහැ. තේරුමක් ඇතිකර ගැනීමට නම් මෙය තමන්ගේ භාෂාවෙන් තේරුම් ගෙන ඊ ලගට පාලි භාෂාවෙන්ම භාවිතා කලත් කමක් නැහැ. එසේ තේරෙන භාෂාවකින් මෙහි අදහස සිහිපත් කරණකොට නීවරණ ධර්මයන් යටපත් වෙනවා. නීවරණ විෂ්කම්භනය වෙනවා. නීවරණ යටපත් වීම නිසා මෛත්‍රියේ අරමුණු පැහැදිලි වෙනවා. මෛත්‍රී අරමුණ පැහැදිළිවෙලා සිත සමාධිගත වෙනවා. ධ්‍යාන සිත් පහළ වෙන්න පුලුවනි. ධ්‍යාන පහළ වුනා හෝ නුනා හෝ විපස්සනාවට හැරෙනවා. විපස්සනාවට හැරීමෙන් සප්ත විසුද්ධි ක්‍රමයෙන් මග ඵල නිවන් අවබෝධ කරගන්නට මේ සූත්‍ර දේශනාව භාවනාවට හැරවීම සඳහා මේ සැලැස්මට අනුව තේරුම් ගනිමු.

**" සුම්හිරි නිවන් සැපතින් සැනසෙන පිණිස මම පිළිවෙත් පිරීමෙහි සමතෙක් වන්නෙමි. අවංක වන්නෙමි. විශේෂයෙන්ම අවංක වන්නෙමි. සුවච කීකරු වන්නෙමි. මෘදු මොලොක් සිත් ඇත්තෙක් වන්නෙමි. නිහතමානී වන්නෙමි. ලද පමණින් සතුටු වන්නෙමි. ලද දෙයකින් යැපෙන්නෙමි. ස්වල්ප වූ කටයුතු ඇත්තෙක් වන්නෙමි. සැහැල්ලු පැවතුම් ඇත්තෙක් වන්නෙමි. සන්සුන ඉඳුරන් ඇත්තෙක් වන්නෙමි. කයින් වචනයෙන් සංවර වන්නෙමි. කිසිවකු කෙරෙහි තෘෂ්ණා වශයෙන් නො ඇලෙන්නෙමි. කුඩා වුවද පාපයක් නො කරන්නෙමි. මම නිදුක් වෙමි. නීරෝගී වෙමි. සුවපත් වෙමි. මා මෙන් සියලු ප්‍රාණීහුද සියළු භූතයෝද, සියළු අනාර්යයෝද,සියළු ආර්යයෝද, දික් ශරීර ඇති සියළු සත්වයෝද, කෙටි ශරීර ඇති සියළු සත්වයෝද, මහත ශරීර ඇති සියළු සත්වයෝද, මධ්‍යම ශරීර ඇති සියළු සත්වයෝද, කුඩා ශරීර ඇති සියළු සත්වයෝද, වටකුරු ශරීර ඇති සියළු සත්වයෝද, සියුම් ශරීර ඇති සියළු සත්වයෝද, ළඟ සිටිනා සියළු සත්වයෝද, දුර සිටිනා සියළු සත්වයෝද, දුටු විරු සියළු සත්වයෝද,නොදුටු විරු සියළු සත්වයෝද, උපන්නාවූ සියළු සත්වයෝද, උපදිමින් සිටින්නාවූ සියළු සත්වයෝද, නිදුක් වෙත්වා, නීරෝගී වෙත්වා,සුවපත් වෙත්වා කිසිවෙක් කිසිවෙකුට වෛර නොකරත්වා අවමන් නොකරත්වා වංචා නොකරත්වා දුකක් නොසිතාවා සියළු සත්වයෝ සියළු සතුන්ගේ සැපයට කැමති වෙත්වා, දයාබර මව් කෙනෙක් එකම දරුවා කෙරෙහි යම්සේ මෙත් සිත පවත්වන්නේද එසේම සියළු සත්වයෝ සියළු සතුන් වෙත අතිශයින් ශාන්ත සීතල මෙත් සිත වඩත්වා. "**

**උඩ යට සරස දස දිසාවේම සියළු සත්වයෝ අතිශයින් ශාන්ත වූ ප්‍රනීත වූ මෛත්‍රී සිත වඩත්වා ඉඳින සිටින ඇවිදින නිදන සැම ඉරියව්වෙහිදීම අතිශයින් ශාන්ත සීතල මෙත් බඹ විහරණයෙන් වෙසෙත්වා.**

**පිරිසිදු සීලයෙන් සුවදවත් වී උතුම් ඤාණාලෝකයෙන් ආලෝකවත්වී නාමරූප පරිච්ඡේද ඤාණයේ පටන් දස මහා විපස්සනා ඤාණය පහලකර ගැණීමෙන් සියළු ආශාවන් දුර හැර බුදු පසේබුදු මහරහතන් වහන්සේලා පැමිණ වදළා වූ සතර මග පිළිවෙලින් පැමිණෙන්නාවූ අතිශයින් ශාන්ත සීතල වූ අමා මහ නිවන් සුවයෙන් සියළු සත්වයෝ සුවපත් වෙත්වා. "**

මේ කරණීය මෙත්ත සූත්‍රය භාවනාවට නගන්න පුළුවන් ඉතාම සරල ක්‍රමයක්. මෙයින් තමන්ගේ ජිවිතයට ගුණාංග පහළොවක් පළමුවෙන් ඇතුලත් කරගන්නවා. ඊ ලගට සියලු සතුන් වෙත මෛත්‍රී සිත් පවත්වනවා. ඊ ලගට විදර්ශනාවට හැරෙනවා. මේ පිළිවෙල අනුගමනය කිරීමේදී තමන්ට දැනෙනවා තමන්ගේ සිත මෛත්‍රියෙන් පිරෙන බව. කොයි තරම් ශාන්ත මෛත්‍රියක් තමන්ගේ සිතේ පහළ වෙනවාද කියන එක තමන්ට වටහාගන්න පුළුවන්.

හරියට කලයකට වතුර පුරවන්නා වගේ , හුලං බෝලයකට හුලං පුරවන්නා වගේ අපේ චිත්ත සන්තාන වල ඉතිරියක් නැතිව මෛත්‍රිය පිරෙන හැටි අපට දකගන්න පුලුවන් වෙනවා.එම නිසා කිසිම අරමුණකදී අපේ සිත ගැටෙන්නේ නැතිව බොහොම ශාන්තව තැන්පත්ව පවත්වන්නට පුලුවන් වෙනවා.

එයින් අප රක්නා ශීලය ඉතාම පිරිසිදු වෙනවා. අපේ සිතේ නීවරණ ඇත් වෙනවා ධ්‍යාන වැඩෙනවා. සිත සමාධිමත් සිතක් බවට පත්වෙනවා. එයින් අප දීර්ඝ සංසාරය කෙටිකරගෙන අමා මහ නිවනට ආසන්න වෙනවා.

ඒ වගේම මේ මෙත්ත සූත්‍රය අනුව භාවනා කරන යෝගාවචරයාට සැපසේ නින්ද යනවා. සැපසේ අවදි වෙනවා. නපුරු සිහින දකින්නේ නැහැ. දෙවියන්ට ප්‍රිය වෙනවා. මනුෂ්‍යයන්ට ප්‍රිය වෙනවා. දෙවියන්ගේ ආරක්ෂාව ලැබෙනවා. වස විස ගිනි විපත් වළකිනවා. මුහුණේ වර්ණය පැහැපත් වෙනවා. සිත සමාධි ගත වෙනවා. නොමුලාව අවසාන මොහොත ගත කරනවා. මෙයින් ධ්‍යානයක් ලබාගත්තා නම් ඒකාන්තයෙන්ම  බඹලොව යනවා. නොඑසේනම් සුගතියට යනවා.

යම් විදිහකට මේ ජිවිතයේ මේ භාවනාව විදර්ශනාවට හැරී පාරමී පිරී තිබුනා නම් සතර මග පල පිළිලෙින් අමා මහ නිවන් සුවය ඒකාන්තයෙන්ම අත්වෙනවා.

මේ විදිහට ලෞකික වුද ලෝකෝත්තර වුද අනේක ආනිශංසයන් ගෙන දීමට හේතුවන ඉතාමත්ම ශ්‍රේෂ්ඨ වූ කරණීය මෙත්ත සූත්‍රය අප තව දුරටත් දවසින් දවස භාවිතා කිරීමෙන් බුදු පසේබුදු මහරහතන් වහන්සේලා නිවී

සැනසි වදල අජරාමර ශාන්ත නිවන් සුවයම ප්‍රර්ථනා කරමු.

“ ආකාසට්ඨා ච භුම්මට්ටා - දේවනාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු බුද්ධ සාසනං ”

ධර්ම ශ්‍රවනානිංසමය කුසල බලයෙන් සැමට උතුම් වූ නිවන් සුව අත්වේවා.

***සාධු / සාධු // සාධු ///***



පරිගනක ගතකිරීම - ලලිත් සිරිමෙවන් දිසානායක
අංක - 55
කෝවිල්මඩ
උඩදුම්බර
දු ක - 081-5675023

**2006-02-09**